504 දී ලංකා රාජ්‍යයේ සිහසුනට පත්විය. ඔහුගේ ඇවෑමෙන් එළඹුණා දෙවෙනිපියතිස්ස රජු සමය (ක්‍රි.පූ. 306) ඉතා සාමකාමී යුගයක් වීතිබුණි. ගම්, නගර රාශියක් බිහිවී, ගස් වවා, වැව් හා ඇලවේලි තනවා, වාරිමාර්ග ඉදි කොට තිබුණු අතර, 437 දී පළමුවරට කීර්තිමත් අනුරාධපුරය අග නගරය බැව් අපට අසන්නට ලැබුණි.

ක්‍රි.පූ. 306 දී අශෝක අධිරාජයා වෙත වර්ග අටක මුතු, නිල් මැණික්, නිල් කැට, රතු කැට, දකුණට කරකැවුණ හක් ගෙඩි (වාලම්පූරි) ආදියෙන් සමන්විත පුද පඬුරුද රැගත් දූත පිරිසක් යවනු ලැබුවේ දෙවෙනි පිය තිස්ස රජු විසිනි. මෙහි අන්තිමට සඳහන් හක් හෙඬි වර්ගය ප්‍රතිවිරුද්ධ දෙසට කරකැවීතිබීම නිසා අද්භූත විශ්වාස මත පදනම් වූ අසාමාන්‍ය වටිනාකමක් ඇති දෙයකි. කෘතගුණ සැලකීමක් ලෙස අශෝක රජු ගෙන් දෙවනි පියතිස් රජු වෙත චාමරයක්, නළල් පටයක්, රාජකීය අසිපතක්, අවි කුඩයක්, රන් මිරිවැඩි සඟලක්, ඔටුන්නක්, මල් බඳුනක්, සහ මේවාට අමතරව ගංගා නම් ගඟේ ශුද්ධ වූ පැන්, අධික මිලැති සුවඳ සාරවිට, සඳුන් ද, රාජකීය පෙලපතක ඉතා රූමත් කන්‍යාවක් ද තෑගි වශයෙන් ලැබුණි. දෙවනිපියතිස්සගෙන් පසු රජ වූ 1 වැනි තිස්ස ගේ කාලයේදී බුදු දහම රටේ ජාතික ආගම ලෙස ස්ථාපිත විය. තිස්ස රජුද ඉන්දියාවේ ධර්මාශෝක රජු වෙත දූත පිරිසක් යැවුයෙන් පිළිතුරු ලෙස ලැබුණා ඉතා වටිනා තෑගි අතරට උපදේශක මඬුල්ලක්ද ඇතුලත් විය. ඔවුන් අත එවූ පණිවුඩය නම් සිංහලයින්ට බුදුන්, දහම් හා සඟුන් සරණ යන ලෙස කරන අනුශාසනාවයි. පණිවුඩකරු වුයේ ධර්මාශෝක ගේ පුත්, බුද්ධ ශ්‍රාවකයෙකු වූ මහින්ද තෙරණුවන්ය. ඔහුගේ පැමිණීමත් සමග නව ඇදහීම නීත්‍යානුකූලව ස්ථාපිත වූ අතර, බණ ඇසීම සඳහා ඉන් පෙර කිසිදු අවස්ථාවක නොවු විරූ පරිදි විශාල ලෙස ජනයා එක් රොක්වූහ. ධර්මායතන හා පන්සල් ගොඩ නැගිණා. මහින්ද තෙරණුවෝ සිය මෙහෙවර සම්පූර්ණ කිරීම සඳහා භික්ෂුණී සසුනක් පිහිටුවීම පිණිස සිය නැගණිය වන සංඝමිත්තා කැඳවා ගෙන ඒම සඳහා සිය බෑණා වන අරිට්ඨ පිටත් කර යැවුහ. ඇය පැමිණෙන විට බුදුන් වහන්සේ බුද්ධත්වයට පත් වු මොහොතේ සෙවණ සැලසූ බෝධියෙන් අංකුරයක් ගෙන ආවෙන් එය අනුරාධපුරයේ රෝපණය කරන ලදී.

ඉතා විශිෂ්ට ගණයේ ගොඩනැගිලි රාශියක් ඉදි කෙරුණේ මෙම 1 වෙනි තිස්ස රජුගේ කාලයේදීය. දැවැන්ත ථූපාරාමය ඉන් එකකි. ක්‍රි.පූ. 266 තිස්ස රජුගේ අභාවයෙන් පසු සිහසුනට පත් වූයේ සූරතිස්සය. ඔහු යටතේ සේවයට බඳවාගෙන සිටි සේන සහ ගුත්තික නම් වූ මලබාර් නායකයින් දෙදෙනෙකු විසින් රජු බලයෙන් පහ කරන ලදුව සුළු කලකින්ම ඔහු ජීවිතක්ෂයට පත් විය. මෙම විදේශිකයින් දෙදෙනා අවුරුදු තිහක් හොඳින් එමෙන්ම ශ්‍රද්ධාන්විත ලෙස රට පාලනය කලෝය. පසුව දේශීය කුමරෙකු වන අසේල විසින් ඔවුන් එළවා දමන ලදී. දෙමළ එළාර විසින් මහවැලි ගං තීරයේදී රාජකීය හමුදාව සමග ගැටී ඔවුන් පරාජය කොට අසේල පදවියෙන් පහ කොට රජ විය. එළාර, තිස්සගේ බෑණා කෙනෙකු වන ගැමුණු ඔහුට විරුද්ධව නැගී සිටි විට සියතින්ම දිවි නසා ගන්නා තෙක් දිග කාලයක් රජකම් කලේය. ගැමුණු රජ ඔහුට පෙර රජ කමට පත් වූ පහත් මට්ටමේ පුද්ගලයින් මෙන් නොව, මහත් වෙහෙසක් දරා රාජකීය නගරය වන අනුරාධපුරය එහි ශ්‍රේෂ්ඨත්වයේ ඉහලම තලයට ගෙන ආවේය.

ගැමුණු රජුගේ මරණයෙන් පසු කාලය තුල සිදු වු සිදුවීම් මග හැර ඉන් ඔබ්බට ගිය

*<u>රටේ ශුභ සාධනයට ඉතා දැඩි අභියෝගයක් එල්ල වුයේ වලගම්බාහු රජුගේ ලේලිය, අනුලාගේ ප්‍රවේශයත් සමගය. ඇගේ චරිතය සෑම අතින්ම නීරෝට සමානය. ක්‍රි.පූ.50 දී ඇය තනිවම රාජ්‍ය පාලනය කරනු වස් සිය සැමියා වූ කුඩා තිස්ස මැරවුවාය.</u>*

තැන ක්‍රි.පූ.1 වන සියවසේ සටහන්ව ඇත්තේ මෙවැනි සිදුවීමකි. මලබාර් දෙමළ ජාතිකයින් විසින් වලගම්බාහු රජ බලයෙන් පහ කොට අවුරුදු දා හතරක් රටින් පිටුවහල් කොට තබා ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස රට අරාජක වී, ලේ වැගිරීම් හා වියවුල් සහගත තත්වයක් උදාවිය. එම තත්වය රජු නැවත බලයේ පිහිටුවන තෙක්ම පැවතිණා. රජු සිය ජයග්‍රහණය සිහිකරනු වස් අනුරාධපුරයේ තැනූ විශාල දාගැබ අභයගිරි යනුවෙන් හැඳින්වේ.

රටේ ශුභ සාධනයට ඉතා දැඩි අභියෝගයක් එල්ල වුයේ වලගම්බාහු රජුගේ ලේලිය, අනුලාගේ ප්‍රවේශයත් සමගය. ඇගේ චරිතය සෑම අතින්ම නීරෝට සමානය. ක්‍රි.පූ.50 දී ඇය තනිවම රාජ්‍ය පාලනය කරනු වස් සිය සැමියා වූ කුඩා තිස්ස මැරවුවාය. ඉන් පසු සිය ප්‍රේමවන්තයින් කිහිප දෙනෙකුම බලයට පත් කලද, ඔවුන් කෙරෙහි කලකිරුණා සැණින් මරා දමන තෙක් පමණි. යටත් වැසියන් බෙහෙවින් පිළිකුලට පත්ව ඇගේ දිවි තොර කරන තෙක්ම එම ක්‍රියාවලිය එසේම පැවතුණි. මේ නිර්ලජ්ජී පාලිකාවගේ අතිශය කුරිරු ක්‍රියාවලින් අනුරාධපුරය යථා තත්වයට පත්වීමට ඉන් පසු වසර ගණනාවක් ගත වන තුරුම නොහැකි විය.

මේ කාලයේ ලංකාවේ පැවති පසුබිම පිළිබඳ අවබෝධයක් ලබා ගැනීමට සංචා රකයින් කිහිප දෙනෙකුගේ සටහන් අපට ඉවහල් වේ. රාජ්‍යයේ බලය සහ වත් පොහොසත්කම් ගැන මහාවංශයේ සහ අනෙකුත් දේශීය ලේඛන වල අන්තර්ගතයට ඉතා කිට්ටුවෙන් සැසඳෙන තොරතුරු ෆා හියන් නම් චීන ජාතිකයා අපට ඉතිරි කර ගොස් ඇත. බටහිර ලෝකයෙන්ද අපට සාක්ෂි තිබේ. හතර වන සියවසේ දිවයිනට පැමිණි තිබන් නමැත්තෙකු ගැන සාන්ත ඇම්බ්‍රෝස් අපට කියයි. රටේ පාලකයා ගැන විස්තර කරන ඔහු, තැප්‍රොබේන් දිවයිනේ ඉතා ශ්‍රේෂ්ඨ රජෙකු සිටී යනුවෙන් පවසයි. ක්‍රි.පු. 200 සිට ක්‍රි. ව. 500 අතර කාලය චිත්‍ර කලාව හා ලේඛන කලාව අතින් අනුරාධපුරයේ ස්වර්ණමය යුගයයි. එමෙන්ම, මෙම කාලය සිංහල ජාතිය විද්‍යාත්මක, ඓතිහාසික හා කාව්‍යමය අංශයන්ගෙන් අති දක්ෂ කුසලතාවයන් විදහා දැක්වූ කාලය වශයෙන්ද අපට හැඳින්විය හැකි ය.




සන්නස
අන්තර්ජාලයෙන්
www.sannasa.net

*සටහන 1*

*කීර්තිමත් සාහිත්‍යයකට උරුම කම් කියන රටක, සුදුසු වකවානුවක, බුදු දහමේ බීජ වපුරනු ලදුව එය ඉතා සාර්ථක ලෙස වැඩී දියුණු වීගියේය. එහි ප්‍රතිඵලයක් ලෙස බුදු දහමේ සිද්ධාන්ත සහ විනය මූල ධර්ම බුදුන් වහන්සේ ජීවමානව සිටි කාලයේ හෝ ඊට ආසන්න පසු කාලයකදී ලොව විශිෂ්ටතම භාෂාවක් වන පාලි භාෂාවෙන් කිසි දිනෙක නොමැකෙන පරිදි සටහන් කර තබන ලදී. වියරු වැටුණු අන්‍යාගමිකයෝ වරින් වර ඒවා විනාශ කර දැමීමටත්, බුදු දහම අදහන්නන් සමූලඝාතනය කිරීමටත් උත්සාහ කලහ. ඉන්දියාවෙන් පැන ගිය සරණාගතයෝ දහම් පොත්ද රැගෙන විත් ලංකාවේ සැඟවුණාහ. ලංකාවේ මෙම ධර්මය අඩංගු ලේඛන මුලින් ලියැවුණ භාෂාවෙන් හෝ, භාෂාවේදීන් ගේ මතයට අනුව, මුල් භාෂාවට බොහෝ සෙයින් සමාන අධි ප්‍රාකෘතයෙන් හෝ ලියා අදද නොනැසී පවතී. හින්දු ලේඛකයෙකු කියන පරිදි, සංස්කෘත යනු, දෙවියන්ගේ භාෂාවය. ප්‍රාකෘත යනු, පරහිතකාමී බුද්ධිමතුන්ගේ භාෂාවය. මෙම ලේඛන පාලි පිටකත්‍රය යනුවෙන් හැඳින්වේ. පිටකන් යන්නෙන් පැස හෝ කූඩය ද, තයෝ යන්නෙන් තුන යන අරුතද දක්වයි. මෙම ලේඛන කොටස් තුනකින් සමන්විතය. විනය මගින් භික්ෂුන් වහන්සේලාටද, සූත්‍ර මගින් ගිහියන්ටද, අභිධර්මය මගින් දෙවියන්, බඹුන් ආදී දෙව්ලොව වෙසෙන අයටද ආමන්ත්‍රණය කර ඇත. ක්‍රිස්තු පූර්ව 88 වලගම්බාහු රජ සමයේදී ලේඛනගත කරන තෙක් මේ සියල්ල රැකුණේ වාචිකවය.)*

## ජීවිතේ සුන්දරයි මේ තරම් !!....

*ජීවිතේ කියන්නෙ පුදුමාකාර දෙයක්. විටෙක හිතාගන්න බැරි තරම් සතුටක් ගෙන දෙන අවස්ථාවල් අපේ ජීවිතේට උදාවෙනවා වගේම, උහුල ගන්න බැරි තරම් දුක් කන්දරාවක් හිස මත පටවා ගෙන ඇස්වල කඳුළු ඉවර වෙනකල් අඬන්න තරම් සිද්ධ වෙන අවස්ථාවලුත් ඕන තරම් අපේ ජීවිතේට එනවා. සමහර වෙලාවට සමහරු කොයි තරම් දුකෙන් වද වේදනාවල් විඳගෙන ඒත් ලෝකෙට පේන්න හිනාවෙලා ජීවත් වෙනවද? අපේ සතුට අපිට පාලනය කර ගන්න පුළුවන් වුණාට, අපේ දුක අපිට කවදාවත් පාලනය කර ගන්න බැහැ. විඳින්න තියෙන ජීවිතෙන් හතරෙන් තුනක්ම අපි විඳවනවා. මේ දහම කාටත් පොදුයි.*

*හිතට දුකක් දැනෙන කොට ඒ දුක හැම වෙලාවම අපිව තල්ලු කරන්නෙ ජීවිතේ පරාජිත පැත්තට. සමහරු වෙලාවකට ජීවිතේ දරා ගන්න බැරුව ඒ ජීවිතේ දාලා යනවා. සමහරු පරාජිත මනසින් ඒ දුක මතක් කර කර ඕන වෙලාවක අඬනවා. දුකක් අපේ හිතේ තියෙන තාක්කල් හැමවිටකම අපේ හිතේ කැරකෙන්නෙ අවාසනාවන්ත සිතුවිලි. ඒත් ඒ දුකේම ගැලී ඉන්න එකෙන් ඵලක් තියෙනවද? දුක් කරදර වැඩි වෙද්දී ජීවිතේ හයියෙන් අල්ල ගන්න නම් ඒ දුක් වලින් අත් මිදෙන්න නම් අපි කාර්‍ය්‍ය බහුල වෙන්නෝනි. කරල ඉවර කරගන්න බැරි තරම් වැඩ ගොඩක් හිතේ පෙළ ගස්වා ගත්තම, පරාජිත සිතුවිලි වලට අපිව මානසිකව හෙම්බත් කරන්න ඉඩක් ලැබෙන්නෙ නෑ. ඒ තැනට එකතු වෙන්නෙ නිම කරන්නට ඉතිරිව ඇති කාර්යයන් පිළිබඳ සිතුවිලියි. ඒ නිසා හිතට ඉඩදෙන්න අළුත් අළුත් වැඩවලට යොමුවෙලා ඔබව කාර්‍ය්‍ය බහුල කරවන්න.*

*පාලනය කර ගත නොහැකි සතුටක් දැණුනම ඒ සතුට දොරේ ගලන්නට ඉඩදෙන සිතටම, පාලනය කර ගත නොහැකි දුකක් දැනුනම කාර්‍ය්‍ය බහුල වෙන්න ඉඩදී බලන්න. ඔබව පරාජය කරන්නට කාටවත් බැරි බව ඔබටම දැනේවි !*

**මේනකා ජයතිලක** ක්වීන්ස්ලන්තය